www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

47307

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | විෂයය / பாடம் / Subject | පත්‍රය / வினாத்தாள் / Paper | කාලය / காலம் / Time |
|---|---|---|---|
| 08 | ඉතිහාසය | I ;II | පැය 02යි. |

නම:-...................................................... විභාග අංකය:-..........................................

සැලකිය යුතුයි.

- I කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 1 - 20 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

## I කොටස

01. මහවිලච්චිය වැව ඉදි කරවන ලද්දේ මින් කුමන රජතුමා ද?
1. දේවානම්පියතිස්ස රජතුමා
2. වසභ රජතුමා
3. දෙවන අග්බෝ රජතුමා
4. පළමුවන පරාක්‍රමබාහු රජතුමා

02. එක් වැවක ජලය තවත් වැවකට රැගෙන යාම පිණිස කරවන ලද ඇළ මාර්ගයක්ට හොඳම නිදසුනක් වන්නේ
1. ඇළහැර ඇළ යි.
2. මිනිපේ ඇළ යි.
3. තලවතු ඇළ යි.
4. යෝධ ඇළ යි.

03. ප්‍රභූ ජනයා සඳහා තැනවූ රාජකීය උද්‍යාන දෙකක් නිවැරදිව සඳහන් පිළිතුර තෝරන්න.
1. නන්දන උයන, පද්මස්වර උයන
2. රන්මසු උයන, සීගිරි ජල උද්‍යානය
3. මහ මෙවුනා උයන, රන්මසු උයන
4. නන්දන උයන, සීගිරි ජල උද්‍යානය

04. නව පෝරණුවක් සකස් කර ප්‍රමිතියෙන් යුතු ගඩොල් නිෂ්පාදනය කර, ප්‍රතිසංස්කරණය කරන ලද දාගැබ මින් කුමක් ද?
1. ජේතවන දාගැබ
2. අභයගිරි දාගැබ
3. ථූපාරාම දාගැබ
4. රුවන්මැලි සෑ දාගැබ

05. මයිනහමක් ආධාර කරගෙන යකඩ නිස්සාරණය කළ බවට තොරතුරු හමු වී ඇත්තේ කුමන ප්‍රදේශයෙන්ද?
1. සමනල වැව
2. දෙහිගහ ඇළ කන්ද
3. මන්නාරම
4. අනුරාධපුරය

06. හින්දු බලපෑම නිසා සඳකඩ පහනින් ඉවත් වූයේ මින් කුමන සත්ත්ව රූපය ද?
1. සිංහ
2. හස්ති
3. අශ්ව
4. වෘෂභ

07. රාජසිංහ රජු උඩරට ආක්‍රමණය කරද්දී මන්නාරමට පලාගොස් පෘතුගීසීන්ගේ රැකවරණය පැතූ රජතුමා
1. දොන් ජුවන් ධර්මපාල ය.
2. පළමුවන විමලධර්මසූරිය ය.
3. කරලියැද්දේ බණ්ඩාර ය.
4. ජයවීර බණ්ඩාර ය.

08. දෙවන රාජසිංහ රජතුමා සම්බන්ධ පහත වගන්ති අතුරෙන් අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
1. මෙතුමාගේ පියා සෙනරත් රජුය.
2. පෘතුගීසීන් නෙරපා හැරීමට ඉංග්‍රීසීන්ගෙන් සහාය ලබාගත්තේය.
3. රජවීමට පෙර මොහුගේ නම මහා අස්ථාන කුමරුය.
4. ගන්නොරුව සටනේ නායකත්වය ගත් රජතුමාය.



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

09. ● දළදා මාළිගයට පත්තිරිප්පුව තැනවීම.
● ඉංග්‍රීසීන් විසින් ඉන්දියාවේ වෙල්ලෝරයට පිටුවහල් කිරීම.
ඉහත කරුණු හා සම්බන්ධ රජතුමා කවුරුන්ද?
1. ශ්‍රී විජය රාජසිංහ රජු
2. කීර්ති ශ්‍රී රාජසිංහ රජු
3. රාජාධිරාජසිංහ රජු
4. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු

10. පුනරුද සමයේ ඉතාලියේ බිහි වූ වෙළෙඳ නගර පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
1. වැනීසිය, ජිනෝවා
2. ජිනෝවා, කොන්ස්තන්තිනෝපල්
3. බැග්ඩෑඩ්, ප්ලෝරන්ස්
4. ඇලෙක්සැන්ඩ්‍රියා, කැන්ටන්

11. පව් සමා කිරීමේ පත්‍ර විකිණීමට විරුද්ධව මාටිං ලූතර් පියතුමා තමාගේ අදහස් ඇතුළත් පත්‍රිකාවක් අලවන ලද දේවස්ථානය මින් කුමක් ද?
1. ශාන්ත පීතර දේවස්ථානය
2. විටෙන්බර්ග් දේවස්ථානය
3. සිස්ටයින් දේවස්ථානය
4. පාතිනන් දේවස්ථානය


12. ආසියාවට නව මුහුදු මාර්ගයක් සෙවීමේ අපේක්ෂාව මල්ඵල ගන්වමින් ඉන්දියාවේ කැලිකට් නගරයට පැමිණි ප්‍රථම පෘතුගීසි ජාතිකයා
1. ක්‍රිස්ටෝපර් කොලොම්බස්
2. නාවික හෙන්රි
3. වස්කෝ ද ගාමා
4. ෆර්ඩිනන්ඩ් මැගලන්

13. පෘතුගීසීන්ගේ පෙරදිග පාලන මූලස්ථානය පිහිටි ප්‍රදේශය හැඳින්වූයේ කුමන නමින් ද?
1. බතාවිය 2. කල්කටා 3. පොන්ඩිචේරි 4. ගෝව

14. පෘතුගීසීන් මෙරටට පැමිණෙන අවධියේ යාපනය පාලනය කළ රජතුමා වූයේ
1. පරරාජසේකරම් ය. 2. සංකිලි ය. 3. කුලසේකර ය. 4. වරෝදය ය.

15. පෘතුගීසීන් විසින් කනකපුල්ලේ ලියන්නන් මයෝරාළවරුන් වැනි සුළු නිලධාරීන් පත්කර තිබුණේ පහත කවර කාර්යයක් සඳහා ද?
1. ලේඛන කටයුතු සඳහා
2. වෙළෙඳ ද්‍රව්‍ය පිටරට යැවීම සඳහා
3. නීති සකස් කිරීම සඳහා
4. ආදායම් එකතු කිරීම සඳහා

● අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති ලෝක සිතියම උපයෝගී කර ගනිමින් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.




16. A අක්ෂරයෙන් පෙන්වා ඇති රට
1. ස්පාඤ්ඤය 2. ප්‍රංශය 3. පෘතුගාලය 4. ඕලන්දය

17. B අක්ෂරයෙන් පෙන්වා ඇති සාගරය
1. ඉන්දියන් 2. අත්ලාන්තික් 3. ආක්ටික් 4. පැසිෆික්



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

18. C අක්ෂරයෙන් පෙන්වා ඇති වෙළෙඳ නගරය
   1. වැනීසිය   2. රෝමය   3. කොන්ස්තන්තිනෝපල්   4. පීකිං

19. D අක්ෂරයෙන් පෙන්වා ඇති මුහුද
   1. කළු මුහුද   2. මධ්‍යධරණී මුහුද   3. බෝල්ටික් මුහුද   4. රතු මුහුද


20. E අක්ෂරයෙන් පෙන්වා ඇති වරාය
   1. ගෝව   2. කැලිකට්   3. මදුරාසිය   4. බොම්බාය

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

- පළමුවන ප්‍රශ්නය අනිවාර්යය වේ.
- අනෙකුත් ප්‍රශ්න අතුරින් හතරක් තෝරාගෙන පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

01. (i) පහත A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.



A

(අ) (i) A පින්තූරයේ දැක්වෙන පොකුණෙහි නම කුමක් ද? ..........................................

(ii) මෙම පොකුණ දක්නට ලැබෙන්නේ කුමන ඓතිහාසික නගරයේ ද?

..........................................

(iii) පොකුණු සඳහා ස්ථාන තෝරා ගැනීමේ දී වඩාත් සැලකිල්ල දක්වූ කාරණය කුමක් ද?

..........................................

(iv) මෙම පොකුණෙන් ඉටුකරගත් එක් අවශ්‍යතාවයක් ලියන්න. ..........................................



B

(ආ) (i) B පින්තූරයේ දැක්වෙන පුද්ගලයාගේ නම කුමක් ද?..........................................

(ii) ඔහුගේ මව්රට නම් කරන්න.

..........................................

(iii) මොහුගේ නමින් ඇති සමුද්‍ර සන්ධිය කුමක් ද?

..........................................

(iv) මොහුගේ ගමන නිසා ලෝකය සම්බන්ධව තහවුරු වූ මතය කුමක් ද?

(ලකුණු 2 × 8 = 16)

02. (i) පහත සඳහන් වැව් කරවූ රජවරු පිළිවෙළින් නම් කරන්න.
   (a) මින්නේරිය වැව
   (b) කලාවැව
   (ලකුණු 02)

(ii) විශාල වැව් තැනවීම නිසා ලාංකිකයින් ලබාගත් ජයග්‍රහණ දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) වැවක ප්‍රධාන අංග තුනක් වන රළපනාව, ඇතුළුවාන හා පිටවාන මගින් ඉටු වූ කාර්යභාරය විස්තර කරන්න.
(ලකුණු 05)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

03. (i) පුරාණයේ ආරෝග්‍යශාලා පැවති බවට සාධක හමුවන ස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 02)
(ii) පැරණි ආගමික ගොඩනැගිලි වර්ග හතරක් ලියන්න. (ලකුණු 04)
(iii) අපේ පැරණි මුතුන් මිත්තන් සතුව පැවති මැටි බඳුන් නිපදවීමේ තාක්ෂණය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

04. (i) මහනුවර රාජධානියට ඇතුළුවීම සඳහා පැවති දුර්ග මාර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 02)
(ii) උඩරට සමාජයේ පැවති විවාහ ක්‍රම දෙකක් පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)
(iii) මහනුවර රාජධානියේ කෘෂිකර්මය හා කර්මාන්ත පැවති ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

05. (i) පුනරුද සමයේ පහත සඳහන් කලා නිර්මාණ ලොවට දායාද කළ පුද්ගලයින් පිළිවෙළින් නම් කරන්න.
(a) පියෙටා ප්‍රතිමාව
(b) අන්තිම රාත්‍රී භෝජනය චිත්‍රය (ලකුණු 02)
(ii) පුනරුද සමයට පෙර අවධියේ කලා ශිල්පවල ස්වභාවයන් දෙකක් ලියන්න. (ලකුණු 04)
(iii) පුනරුද සමයේ විද්‍යාවේ ඇති වූ දියුණුව උදාහරණ දෙකක් මගින් විස්තර කරන්න. (ලකුණු 5)

06. (i) දේශගවේෂණයට රාජ්‍ය අනුග්‍රහය ලබාදුන් යුරෝපා රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02)
(ii) පහත සඳහන් රටවල් සොයා ගැනීමේ ගෞරවය හිමිවන පුද්ගලයන් වරහන තුළින් තෝරාගෙන A, B, C, D අනුපිළිවෙළින් ලියන්න.
(ෆ්‍රැන්සිස්කෝ පිසාරෝ, ක්‍රිස්ටෝපර් කොලොම්බස්, කැබේ සහෝදරයෝ, පර්ඩිනැන්ඩෝ කෝර්ටෙස්)
A - කැනඩාව
B - පීරු දේශය
C - මෙක්සිකෝව
D - ඉන්දියාව (ලකුණු 04)
(iii) යුරෝපා ජාතීන් ආසියාවට පැමිණීමේ අරමුණු තුනක් සඳහන් කර, කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

07. (i) විජයබා කොල්ලයෙන් පසුව පහත නම් සඳහන් රජවරු දෙදෙනා රාජ්‍යත්වයට පත් වූ රාජධානි දෙක පිළිවෙලින් නම් කරන්න.
(i) මායාදුන්නේ
(b) හත්වන බුවනෙකබාහු (ලකුණු 02)
(ii) ජනතාව කතෝලික ආගමට හරවා ගැනීමට පෘතුගීසී අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙකක් ලියන්න. (ලකුණු 4)
(iii) පෘතුගීසීන් යටතේ මෙරට ආර්ථික කටයුතු ක්‍රියාත්මක වූ ආකාරය විස්තර කරන්න. (ලකුණු 05)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk